# කොළඹ විශ්වවිද්‍යාලය
## ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (සාමාන්‍ය/ විශේෂ) - දෙවන වසර
## සෙමෙස්තර අවසාන පරීක්ෂණය – පළමු සෙමෙස්තරය - 2018/2019
## DMG 2128 : ජනගහනය සහ පරිසරය

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න** **කාලය: පැය දෙකයි (02)**

**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ එක් පිටුවකින් (01) සමන්විත වේ**

---

1. අ) ජනගහනය සහ පරිසරය පිළිබඳ ඉදිරිපත්වී ඇති 'නියතිවාදය' සහ 'සත්‍යවාදය' යන මතවාද අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) 'ජනගහන වර්ධනය', මිනිසා පරිසරය අභිබවායාමේ යුගය කෙරෙහි ප්‍රවේශ කර ලීමට සෘජු බලපෑමක් ඇතිකල අතර, පාරිසරික ගැටලු ඇතිකරලීමේ මූලික සාධකයක් බවටද පත්විය. ඔබ මෙම කියමන සමග එකග වන්නේද? විමසන්න.

(ලකුණු 14)

2. මිනිසා සහ පරිසරය අතර සබැඳියාව විග්‍රහ කිරීමේදී 'ප්‍රශස්ත ජනගහනයක' අවශ්‍යතාවය පිළිබඳ ඉදිරිපත්කර ඇති මතවාද කවරේදැයි විවේචනාත්මකව විභාග කරන්න.

(ලකුණු 20)

3. අ) වර්ෂ 2010 න් පසු ශ්‍රී ලංකාව මුහුණ දෙන පාරිසරික ගැටලු කවරේදැයි නිදසුන් දෙමින් විමසන්න.

(ලකුණු 06)

ආ) එම පාරිසරික ගැටලු වලක්වා ගැනීම සඳහා 2010 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාව ගෙන ඇති ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 14)

4. වර්තමානය වනවිට ලෝකය මුහුණ දෙන සංකීර්ණ පාරිසරික ගැටලු කවරේදැයි පැහැදිලි කර එම ගැටලු අවම කර ගැනීම සඳහා ජාත්‍යන්තර පාරිසරික සංවිධානයන්ගේ ක්‍රියාකාරීත්වය කෙබඳුදැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

5. පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් කරන්න

අ. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම

ආ. මිනිසා විසින් පරිසරය අභිබවා යන යුගය

ඇ. එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන

ඈ. නාගරීකරණය සහ භූමි පරිභෝජනය ඉහළ යාම

(ලකුණු 05 × 4 = 20)